ශ්‍රීලාල් සෙනෙවිරත්න



# 2053 ලෝක විනාශයක්

ලෝක විනාශය ගැන අලුත්ම අනාවැකිය අනුව ලෝක විනාශය සිදුවෙන්නේ 2053 වසරේදී. ඒක සිද්ධ වෙන්නේ මෙන්න මෙහෙමයි.

''2013 වර්ෂය වන විට ලෝක ජනගහනය කෝටි 800 යි. ලංකාවේ කෝටි දෙකක ජනගහනයද ඇතුළත්ව මේ ලෝක ජනගහනය ඉදිරි දශක කීපය තුළදී විශාල වශයෙන් වැඩිවෙනවා. මේ වැඩිවෙන ජනගහනයට අනුව භූමිය වැඩි වෙන්නේ නෑ. භූමියේ තිබෙන ගහ කොළ ආදිය අඩුවෙමින් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කොන්ක්‍රීට් ගොඩනැගිලි ඉදිවීම දිගින් දිගටම සිදුවෙලා ලෝකය කොන්ක්‍රීට් වනාන්තරයක් බවට පත්වෙනවා. එවිට මිනිසා නිර්මාණය වීමට අවශ්‍ය පිරිසිදු වාතාශ්‍රය, ජලය, ආහාර සහ සෞම්‍ය හිරුඑළිය නැතිවෙනවා. අනෙක් අතින් කොන්ක්‍රීට් රත්වීම නිසා පොළොවේ උෂ්ණත්වය විශාල වශයෙන් ඉහළ යනවා. එලෙස උෂ්ණත්වය ඉහළ ගිහින් වර්තමාන සූර්ය රශ්මිය මෙන් සත් ගුණයක් දක්වා පෘතුවියේ උෂ්ණත්වය ඉහළ යන මොහොතේ ලෝකය ගිනි ගෙන විනාශ වෙනවා.''

ඔන්න ඔය විදිහට ලෝකය ගිනිගෙන විනාශ වෙන්නේ 2053 අවුරුද්දේයි. මේ ලෝක විනාශයට කියන්නේ ''කොන්ක්‍රීට් නිසා සිදුවන ලෝක විනාශය'' කියලා.

ලෝක විනාශය ගැන මේ කතාව අහනකොට ඔබට යම් කම්පනයක් ඇතිවිය හැකියි. නමුත් කවද වුනත් මැරෙන්න ඉන්න අපිට කම්පාවට වැඩිය සතුටු වෙන්න කාරණයකුත් මෙහි තියනවා. මේ අපූරු සොයාගැනීම ලංකාවේ තරුණයෙකුගෙ වීමයි ඒ. ඔහුගේ නම එම්. රුවන් නන්දසිරි. ඔහු ගැන ඊට වැඩිය ලොකු විස්තරයක් නම් දැනගන්න මට පුළුවන්කමක් ලැබුණේ නෑ.

මොකද අනපේක්ෂිත ගමනකදි මට ඔහු හමුවුණේ පේරාදෙණියෙදි. අවිස්සාවේල්ල-මහනුවර බසයක මම ගමන් කරමින් සිටින අතරේදි. කාලවර්ණ, පාංශුදේහධාරි මේ යෝදයා අත්පත්‍රිකා මිටියකුත් අරගෙන බස් එකට ගොඩවුනා. දුටුවනම මට හිතුනේ ''රතු කුරුස'' හෝ ''ශාන්ත ජෝන් ප්‍රථමාධාර'' හෝ කණ්ඩායමක කෙනෙක් කියලා. කොණ්ඩේ කොටට කපලා, යුනිෆෝම් එකක් වගේ සුදු අත්දිග කමිසයක් ඇඳගෙන හිටියා. කමිසෙ දෙතුන් තැනක ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික කොඩිය වර්ණයෙන් මුද්‍රණය කරලා තිබුණා. ඉසව්සරහ දොරෙන් බස් එකට නැගලා හාත්පස සිසාරා බැල්මක් හෙළලා ඔන්න ''කොන්ක්‍රීට් ලෝක විනාශය'' ගැන එයාගේ සොයාගැනීම ගැන දේශනය පටන්ගත්තා.

දේශණය අවසන් කළේ මේ අනාවැකිය ජනතාව අතරට ගෙනියන්න අවශ්‍ය අත්පත්‍රිකා මුද්‍රණය කරන්න හැකිනම් ආධාරයක් කරන්න කියන ඉල්ලීමත් සමගින්. දේශණය අවසානයේ තමන්ගේ අතේ තියන අත්පත්‍රිකා බෙදීම ඇරඹුණා. මටත් එකක් ලැබුණා. මම හිමින් හිමින් කියවන්න ගත්තා.
මාතෘකාව ''පෘතුවිය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ජනතාවගේ දායකත්වය ලබාගැනීම'' මේං මෙහෙම කතාවකුත් එකේ තිබුණා.

''මීළඟ මිනිත්තුව තුළ කුමක් හෝ විනාශයක් සිදුවිය හැකිය. එය ස්වාභාවික හෝ අස්වාභාවික වශයෙන් සිදුවිය හැක. අද ශ්‍රී ලංකා ජනතාව වෙසෙන නිවාස භූමිකම්පා, සුළි කුණාටු, නායයාම්, ගංවතුර වැනි ස්වාභාවික විපත්වලට ඔරොත්තු දීමට තරම් ශක්තිමත් නැත. එසේ තිබේ නම් ඒ ජනතාවගෙන් ඉතා සීමිත කොටසක් අතර පමණි. එසේම යම් මොහොතක ශ්‍රී ලංකාවටද න්‍යෂ්ටික බාලාගාරවල විකිරණ කාන්දුවීම, වෙනත් රසායනික අවිතුළ ඇති විෂ වායුන් වලට මුහුණ දීමට සිදුවේ. පරිසරය සුරැකීමටත් හදිසි ආපදාවලට මහුණ දීමටත් නව ඉදිකිරීම් තාක්ෂණයක් බුද්ධිමත් ජනතාවගේ උපදෙස් මත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සියළු ජනයාගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.''

මේක කියවලා ඉවර වෙන්නත් කලින් ඔන්න මේ ''ස්වෙච්ඡා පරිසර නියමු''වා (අත්පත්‍රිකාවේ ඔහු විසින් ඔහුවම හඳුන්වා තිබුණේ එහෙම) අත පා ගෙන මා ගාවටත් අපි.

මේ වැඩේට බකප් එකක් දෙන්න පස්සේ වෙලාවක කතාකරන්නම් කියලා
මම ''නියමුවා''ගේ දුරකථන අංකය ඉල්ල ගත්තා. ඒ වුණාට මට මේ වෙනකම් කතාකරන්න වෙලාවක් ලැබුණේම නෑ. 2053 ලෝක විනාශය වළක්වා ගන්න කැමති කෙනෙක් ඉන්නවා නම් 077-5750001 අංකයට කතාකරලා මෙයාට බකප් එකක් දුන්නට කමක් නෑ. බකප් එකක් නොදුන්නත් ලෝක විනාශය ගැන අලුත්ම තොරතුරු ටිකක් හරි දැනගන්න පුළුවන්වෙයි කතා කළොත්.

''නියමුවා''ගේ අත්පත්‍රිකාවේ අන්තිමට මෙහෙම සඳහනකුත් තිබුණා.

''මෙම විශේෂ පනිවිඩය ජාත්‍යන්තරයට ගෙනයාම උදෙසා මම ඇමරිකා එක්සත් ජනපදයේ පුරවැසිභාවය අපේක්ෂාවෙන් සිටිමි''

''මුද්‍රණ අනුග්‍රහය-බුද්ධිමත් ජනතාව''

ඕං වැඩේ.

# මගේ ලංකාවේ ජාතික කොඩිය

අජිත් පැරකුම් ජයසිංහ

උතුරු පළාත් සභාව පිහිටුවීම ලංකාවේ ජාතීන්ගේ ප්‍රශ්නය සම්බන්ධ ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයකි. එය දෙමළ ජාතිකවාදී දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදී ධාරාව තුළ ස්ථාපනය කර ගැනීම සඳහා ඉවහල් වේ. එහෙත් එම ස්ථාපනය චිරස්ථායී කර ගැනීමේ අභියෝගය අවසන් වී නැත.



**නිල් පාට පසුබිමක් (සාගරය) මැද ලංකාවේ සිතියම වගේ කාටත් පොදු ලාංකික කොඩියක්**

පළාත් සභා යනු බලය බෙදීමේ යාන්ත්‍රණයක් ලෙස දෙමළ ජනතාව විසින් කැමැත්තෙන් භාර ගන්නා ලද එකක් නො වේ. දෙමළ ජාතිකවාදයේ පරමාදර්ශය වන්නේ දෙමළ ජාතිවාදී ඊලාම් රාජ්‍යයකි. සෑම ජාතියකට ම රාජ්‍යයක් හිමි විය යුතු ය යන්න පැරණි සංකල්පයකි. එය පැන නැගුණේ ධනවාදය මෙතරම් ගෝලීයකරණය වූ යුගයක නො වේ. ජාතික රාජ්‍යය වර්තමානයේදී ජාතික වශයෙන් පීඩාවට පත් වූවන්ගේ ප්‍රශ්නයටවත් විසඳුමක් වන්නේ නැත. එහෙයින් අප එය ප්‍රවර්ධනය කළ යුතු නො වේ.

ප්‍රාග්ධනය විෂයෙහි තව දුරටත් ජාතික රාජ්‍ය යනු අරුත්බර ව්‍යුහයක් වන්නේ නැත. හේතුව මේ වන විට ප්‍රාග්ධනය ජාතික දේශ සීමාවන් සිඳ බිඳ ලමින් තිබෙන හෙයිනි. ධනපතියාට සිය ප්‍රාග්ධනය ලෝකයේ ඕනෑම තැනක

> දෙමළ දේශපාලනයේ ජාතිවාදී ප්‍රවණතා පරාජය කළ යුතු ය. එය කළ යුත්තේ මර්දනයෙන් නො වේ. මර්දනයෙන් ජාතිවාදය පරාජය කළ නො හැකි ය. එසේ ම දෙමළ ජාතිවාදයට එරෙහිව සිංහල ජාතිවාදය ශක්තිමත් කිරීමෙන් ද එය පරාජය කළ නො හැකි ය. එය කළ හැක්කේ දෙමළ දේශපාලනය තුළ ප්‍රගතිශීලී ප්‍රවණතා ශක්තිමත් කිරීමෙනි.

ආයෝජනය කළ හැකි වන ආකාරයට ලෝකයේ රාජ්‍ය ව්‍යුහය සැකසෙමින් තිබේ. එහි ජාතිකවාදී ලක්ෂණ අහෝසි වෙමින් තිබේ. ප්‍රාග්ධනය විෂයෙහි ජාතිකවාදයේ බලපෑම අවම වෙමින් තිබේ.

ජාතිකවාදය තව දුරටත් පවතින්නේ ශ්‍රමය සංවිධානය කිරීම යන කාරණයෙහිදී ය. නිදහස් සංචලනය සඳහා ප්‍රාග්ධනයට තිබෙන අයිතිය ශ්‍රමයට ද දිනා ගත යුතු ය. නිදසුනකින් කිවහොත්, ලංකාවේ වැඩ කරන්නට පුළුවන් මිනිසුන්ට ලෝකයේ වඩා හොඳ වැටුප් ගෙවන තැන් වෙත වැඩ සොයා යන්නට නිදහස හිමි විය යුතු ය.

ශ්‍රමයේ නිදහස් සංචලනයට ජාතික රාජ්‍ය සීමා බාධාවකි. ධනපතීන්ට තමන්ගේ ප්‍රාග්ධනය රැ ගෙන නිදහසේ සංචලනය කරන්නට තිබෙන අයිතිය ශ්‍රමිකයන්ට ද දිනා ගැනීම සඳහා අප සටන් කළ යුතු ය. එහිදී කම්කරුවන්ගේ පැත්තෙන් ගත් කල ජාතික රාජ්‍යය යනු අහෝසි කළ යුතු දෙයක් මිස රැක ගත යුතු දෙයක් නො වේ.

එහෙත්, සමස්ත දේශපාලනය ශ්‍රමයට ඌනනය කළ නො හැකි බව මම පිළි ගනිමි. ජාතිය, සංස්කෘතිය, භාෂාව වැනි මනෝ මූලික කාරණාවල වැදගත්කම නිසා මිනිසුන්ට ජාතික රාජ්‍ය අවශ්‍ය ව තිබේ.

අප දේශපාලනිකව මැදිහත් විය යුත්තේ ජාතික රාජ්‍ය සීමා අහෝසි කර දැමීමේ හා ඒවා රැක ගැනීමේ ද්විත්ව උවමනාව මැදට ය. ප්‍රගතිශීලීන්ගේ දේශපාලනය අතිශය සංකීර්ණ වන්නේ මෙම තත්වය තුළයි.

දැන් මේ මොහොතේ උතුරු පළාත් සභාවේ සිදු වන දේ සලකා බලමින් අප විසින් කළ යුතුව තිබෙන්නේ කුමක් ද යන්න ගැන සාකච්ඡා කළ හැකි ය.

දෙමළ දේශපාලනයේ ජාතිවාදී ප්‍රවණතා පරාජය කළ යුතු ය. එය කළ යුත්තේ මර්දනයෙන් නො වේ. මර්දනයෙන් ජාතිවාදය පරාජය කළ නො හැකි ය. එසේ ම දෙමළ ජාතිවාදයට එරෙහිව සිංහල ජාතිවාදය ශක්තිමත් කිරීමෙන් ද එය පරාජය කළ නො හැකි ය. එය කළ හැක්කේ දෙමළ දේශපාලනය තුළ ප්‍රගතිශීලී ප්‍රවණතා ශක්තිමත් කිරීමෙනි.

උතුරු පළාත් සභාව තුළ මතු වූ ලිබරල් ලක්ෂණ අපි අගය කළෙමු. නිදසුනක් ලෙස ලිබරල්වාදී ජීවිතයක් ගත කරන බව බැලු

32 වන පිටට